වසර 11

# අවසාන වාර ඇගයීම - 2023 (2024)

දෙවන බස - සිංහල I, II
இரண்டாம் மொழி – சிங்களம் I, II

ලකුණු
புள்ளிகள்

පැය තුනයි
மூன்று மணித்தியலம்

අමතර කියවීම් කාලය - මිනිත්තු 10
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්නය සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களை தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தை பயன்படுத்துக.

## දෙවන බස - සිංහල I

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1) ,(2) ,(3) ,(4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ලියන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල, **තද කළු අකුරෙන්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.
1 தொடக்கம் 5 வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவு செய்க.

1. ඔයා සිංහල පාඨමාලාවක් **හදාරන්නැද්ද** ?
   (1) හදාරන් නැද්ද (2) හදාරන්න නැද්ද (3) හදාරන්නේ නැද්ද (4) හදාරනවා නැද්ද
2. බැංකුවේ **සල්ලිත්තරන්** එන්න.
   (1) සල්ලිත් අරන් (2) සල්ලිත් තරන් (3) සල්ලි අරන් (4) සල්ලියි අරන්
3. වැඩි මිලට බඩු **ගන්නෙපා.**
   (1) ගන්න නෙපා (2) ගන්න එපා (3) ගන්නේ එපා (4) ගන් එපා
4. **ඔන්නතනින්** වමට හැරෙන්න.
   (1) ඔන්න ඔතනින් (2) ඔන්න තනින් (3) ඔන්න අත්තනින් (4) ඔන්න අතනින්
5. එයාලා අතන **බලන්නින්නේ** මොනවාද?
   (1) බලන් ඉන්නේ (2) බලන් නින්නේ (3) බලනවා ඉන්නේ (4) බලන්න ඉන්නේ

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් **නිවැරදි උච්චාරණය** සහිත පදය තෝරන්න.
6 தொடக்கம் 10 வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் சொல்லைத் தெரிவு செய்க.

6. (1) සගනාධාර (2) සහනාධාර (3) සහනාදාර (4) සහනධාර
7. (1) නොසැලගිල්ල (2) නොසැළකිල්ල (3) නොසැලකිල්ළ (4) නොසැලකිල්ල
8. (1) තෑගි බෙදාදීම (2) තේගි බෙදාදීම (3) තෑගි බෙතාදීම (4) තෑගි පෙදාදීම
9. (1) වැල් දොටම් (2) වෙල් දොඩම් (3) වැල් දොඩම් (4) වැල් දෝඩම්
10. (1) ස්වාමින් වහන්සේ (2) ස්වාමීන් වහන්සේ (3) සුවාමීන් වහන්සේ (4) ස්වාමීන් වගන්සේ

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
  11 தொடக்கம் 14 வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவு செய்க.

11. මගේ ගම එරාවූර්.
    (1) ඔයාගේ ගම මොකක්ද ? (2) ඔයා ආවේ කොහේද?
    (3) ඔයාගේ ගම කොහෙන් ද ? (4) ඔයාගේ ගම කොහේද?

12. ළමයි බස් එකේ ආවා.
    (1) ළමයි ආවේ මොකට ද? (2) ළමයි එන්නේ මොකෙන් ද?
    (3) ළමයි එන්නේ කොහොම ද? (4) ළමයි ආවේ මොකෙන් ද?

13. අංක-50, ප්‍රධාන පාර, කල්මුනේ .
    (1) ඔයාගේ ලිපිය මොකක්ද ? (2) ඔයා ඉන්නේ කොහෙන් ද?
    (3) ඔයා යන්නේ කොහේද ? (4) ඔයාගේ ලිපිනය මොකක්ද ?

14. පාඨමාලා කාලය මාස නවයයි .
    (1) පාඨමාලාවේ නම මොකක් ද? (2) පාඨමාලා ගාස්තුව කීයද ?
    (3) පාඨමාලා කාලය කොපමණ ද ? (4) පාඨමාලා පටන් ගන්නේ කවදා ද?

- අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල **නිවැරදි ව අකුරු** යෙදී ඇති පදය තෝරන්න.
  15 தொடக்கம் 17 வரையான வினாக்களில் **சரியான எழுத்துக் கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவு செய்க.

| | | | | |
|---|---|---|---|---|
| 15. | (1) විෂිශ්ට | (2) විශිෂ්ට | (3) විශිෂ්ය | (4) විෂිශ්ය |
| 16. | (1) සූළි කුණාටුව | (2) සුළි කුනාටුව | (3) සුළි කුණාටුව | (4) සුළි කුණාටුුව |
| 17. | (1) පරිඝණකය | (2) පරිඝනකය | (3) පරිගනකය | (5) පරිගණකය |

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන** පදය තෝරන්න.
  18 தொடக்கம் 20 வரையான வினாக்களில் பொருத்தமற்ற சொல்லைத் தெரிவு செய்க.

| | | | | |
|---|---|---|---|---|
| 18. | (1) මණ්ඩලය | (2) දෙපාර්තමේන්තුව | (3) අධිකාරිය | (4) මධ්‍යස්ථානය |
| 19. | (1) දෙවැනි | (2) තෙවැනි | (3) සිවුවැනි | (4) එවැනි |
| 20. | (1) කනක | (2) මැණික් | (3) රත්න | (4) රුවන් |

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක්** දෙන පදය තෝරන්න.
  21 தொடக்கம் 23 வரையான வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு ஒத்தகருத்தைத் தரும் **சொல்லைத்** தெரிவு செய்க.

| | | | | | |
|---|---|---|---|---|---|
| 21. | සිඳු | (1) . සිදුර | (2) සිංදු | (3) මුහුද | (4) ගංගාව |
| 22. | නිමල | (1) කමල | (2) සුදු | (3) පවිත්‍ර | (4) නිවහන |
| 23. | උදක | (1) ජලය | (2) උදරය | (3) උදෑසන | (4) උදව්ව |

- අංක 24 සහ 25 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
  24 தொடக்கம் 25 ஆகிய வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு எதிர்கருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க.

| | | | | | |
|---|---|---|---|---|---|
| 24. | පුරුදු | (1) දුරුතු | (2) නුපුරුදු | (3) පුහුණු | (4) සුපුරුදු |
| 25. | නිහතමානි | (1) අවංක | (2) අලස | (3) පරාර්ථකාමී | (4) ආඩම්බර |

- අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

26 தொடக்கம் 28 வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்ட படங்களுக்கான மிகப் பொருத்தமான கூற்றைத் தெரிவு செய்க.

26. 

(1) දුම් ප්‍රදේශයකි.
(2) කාර්මික ප්‍රදේශයකි.
(3) දුම්රිය ගමන් කරන ප්‍රදේශයකි.
(4) නිවාස සංකීර්ණයක් ඇති ප්‍රදේශයකි.

27. 

(1) ඉදිරියෙහි දී මාර්ගය පටුය.
(2) පටු පාලම ඉදිරියෙනි
(3) ද්විත්ව රථ මාර්ගය අවසානය ඉදිරියෙනි.
(4) ඉදිරියෙන් මාර්ගය ඉඩදෙනු.

28. 

(1) රථවාහන නැවැත්වීම තහනම්.
(2) රථවාහන පැටවීම තහනම්.
(3) රථවාහන ඇතුල්වීම තහනම්.
(4) රථවාහන නැවැත්වීම සහ පැටවීම තහනම්.

- අංක 29 සහ 30 ප්‍රශ්නවලට ගැළපෙන උත්තරය තෝරන්න.

29 மற்றும் 30 ஆகிய வினாக்களுக்குப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.

29. අවුරුදු සියයක කාලය
(1) සංවත්සරය (2) ශත වර්ෂය (3) ස්වර්ණ ජයන්තිය (4) රජත ජයන්තිය

30. හෙට අඟහරුවාදා නම් පෙරේදා කවුදා ද?
(1) බදාදා (2) සෙනසුරාදා (3) ඉරිදා (4) බ්‍රහස්පතින්දා

- අංක 31 සහ 32 තෙක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.

31 மற்றும் 32 ஆகிய வினாக்களில் இரு வாக்கியஙகள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் இணைத்து ஒரு வாக்கியமாக்கி சரியாக எழுதப்பட்ட வாக்கியத்தைத் தெரிவு செய்க.

31. මල්ලී සඳ දෙස බලයි. මල්ලී සිනාසෙයි.
(1) මල්ලී සඳ දෙස බලා සිනාසෙයි.
(2) මල්ලී සඳ දෙස බලා සිනාසුණි.
(3) මල්ලී සඳ දෙස බලමින් සිනාසෙයි.
(4) මල්ලී සඳ දෙස බල බලා සිනාසුනේ ය.

32. ළමයි වතුරට පැන්නෝ ය. ළමයි සෙල්ලම් කළෝ ය.
(1) ළමයි වතුරට පනිමින් සෙල්ලම් කළෝ ය.
(2) ළමයි වතුරට පැන පැන සෙල්ලම් කළෝ ය.
(3) ළමයි වතුරට පැන සෙල්ලම් කරති.
(4) ළමයි වතුරට පැන සෙල්ලම් කළහ.

- අංක 33 සහ 34 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

33 மற்றும் 34 ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.

33. ඔයා .......................... මම කැමතියි .
(1) ඉන්න නම් (2) ඉන්නවා නම් (3) ඉන්නේ නෑ (4) ඉන්නම්

34. අපි නාට්‍යය ...................... සූදානම්.
(1) පෙන්නුවා (2) පෙන්වනවා (3) පෙන්වීම (4) පෙන්වීමට

- අංක 35 ප්‍රශ්නයේ කළු කර ඇති සංඛ්‍යාව නිවැරදි ව අකුරෙන් ලියා ඇති උත්තරය තෝරන්න.
35 ஆம் வினாவிலுள்ள தடிப்பாக்கப்பட்டுள்ள எண்ணை சரியாக எழுத்துக்களில் எழுதப்பட்ட விடையைத் தெரிவு செய்க.

35. මගේ බැංකු කාඩ් පතේ රහස් අංකය **4474** ය .
ඉහත සංඛ්‍යාව නිවැරදිව ලියා ඇති පිළිතුර වන්නේ

(1) හතරදහස් හතරසිය හැත්තෑ හත
(2) හාරදහස් හතරසිය හැත්තෑ හතර
(3) හාරදහස් හාරසිය හැත්තෑ හතර
(4) හාරදහස් හාරසිය හැට හතර

- අංක 36 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයේ ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.
36 தொடக்கம் 40 வரையான வினாக்களிலுள்ள இலக்கண ரீதியாக சரியான வாக்கியத்தைத் தெரிவு செய்க.

36. (1) ළමයා ද මම ද ගමට ගියෙමු .
(2) ළමයා ද මම ද ගමට ගියේ ය.
(3) ළමයා ද මම ද ගමට ගියෙමි.
(4) ළමයා ද මම ද ගමට ගියෝ ය.

37. (1) මොනරා පිල් විහිදාගෙන නැටුවා ය.
(2) මොනරා පිල් විහිදාගෙන නැටුවේ ය.
(3) මොනරා පිල් විහිදාගෙන නැටුවෝ ය.
(4) මොනරා පිල් විහිදාගෙන නටති.

38. (1) ළමයාගේ සමත්වීම ගැන බොහෝ මිනිස්සු සතුටු විය .
(2) ළමයාගේ සමත්වීම ගැන බොහෝ මිනිස්සු සතුටු වුණේ ය.
(3) ළමයාගේ සමත්වීම ගැන බොහෝ මිනිසුන් සතුටු වූහ.
(4) ළමයාගේ සමත්වීම ගැන බොහෝ මිනිස්සු සතුටු වූහ.

39. (1) ඊයේ උදේ පැවැති රැස්වීමට ළමයි විශාල පිරිසක් පැමිණෙති.
(2) ඊයේ උදේ පැවැති රැස්වීමට ළමයි විශාල පිරිසක් පැමිණෙයි.
(3) ඊයේ උදේ පැවැති රැස්වීමට ළමයි විශාල පිරිසක් පැමිණියහ.
(4) ඊයේ උදේ පැවැති රැස්වීමට ළමයි විශාල පිරිසක් පැමිණියේ ය.

40. (1) වැද්දන් සතුන් දඩයම් කරති.
(2) වැද්දෝ සතුන් දඩයම් කරති.
(3) වැද්දෝ සත්තු දඩයම් කරති.
(4) වැද්දෝ සතුන් දඩයම් කරයි.

*********************************

| වසර 11 | අවසාන වාර ඇගයීම - 2023 (2024) | ලකුණු / புள்ளிகள் |
|---|---|---|
| | දෙවන බස - සිංහල<br>இரண்டாம் மொழி – சிங்களம் I, II | |

## දෙවන බස - සිංහල II   இரண்டாம் மொழி – சிங்களம் II

- I කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළු ව II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න.

  பகுதி I இல் 1 ஆம் 2 ஆம் வினாக்கள் உட்பட பகுதி II இல் ஒரு வினாவையும் பகுதி III இல் இரு வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக ஐந்து வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.

### I කොටස / பகுதி I

1. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් එකක් ගැන වචන 100ක පමණ රචනයක් ලියන්න.
   பின்வரும் தலைப்புக்களுள் ஒன்றைத் தெரிவு செய்து அதன் கீழே தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாள 100 சொற்களில் அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.

(අ) මා ගිය අධ්‍යාපන චාරිකාවක්.

(i) චාරිකාව හැඳින්වීම .
(ii) චාරිකාව සඳහා පෙර සූදානම්.
(iii) චාරිකාවේ දී නැරඹූ ස්ථාන .
(iv) විනෝද වූ ආකාරය.
(v) සමාලෝචනය.

(ආ) එකමුතුකමේ අගය.

(i) හැඳින්වීම .
(ii) එකමුතුව වැඩ කිරීමේ වැදගත්කම.
(iii) කළ හැකි කාර්යයන් .
(iv) ලැබෙන ප්‍රයෝජන.
(v) සමාලෝචනය.

(ඉ) ගංවතුර උවදුර නැති කරමු .

(i) ගංවතුර ඇති වන ආකාරය.
(ii) ගංවතුර උවදුරක් වන ආකාරය .
(iii) ගංවතුරෙන් ඇති වන හානි .
(iv) ගංවතුර උවදුරෙන් මිදීමට කළ හැකි දේ.
(v) සමාලෝචනය.

(ඊ) වැඩිහිටියන්ට ගරු කරමු .

(i) වැඩිහිටියන් යනු කවුරුන් ද?
(ii) වැඩිහිටියන්ට අද අත් වී ඇති තත්ත්වය .
(iii) වැඩිහිටියන් රැක බලා යුත්තේ ඇයි?
(iv) වැඩිහිටියන් වෙනුවෙන් අපට කළ හැකි දේ.
(v) සමාලෝචනය.

(උ) මා ගුරුවරයකු වුණොත්.

(i) කල්පිත මාතෘකාවක් ලෙස සලකා රචනයට අදාළ පසුබිම සකස් කිරීම.
(ii) ගුරුවරයකු වීමට ලැබුණොත් කරන දේවල් උපකල්පනය කිරීම .
(iii) ගුරුවරයකු බවට පත් වීම.
(iv) ගුරුවරයකු වීම නිසා සතුටට පත වීම.
(v) සමාලෝචනය.

2. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න..
( වක්‍යයක අවම වශයෙන් වචන හතරක්වත් තිබිය යුතුය.)
தரப்பட்ட படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள ஐந்து வாக்கியங்கள் எழுதுக. (ஒரு வாக்கியத்தில் குறைந்தபட்சம் நான்கு சொற்களாவது இருத்தல் வேண்டும்.)



## II - කොටස / பகுதி -II

- 3 හා 4 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.
  3 ஆம் 4 ஆம் வினாக்களுள் ஏதேனும் ஒரு வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.

**3.** පහත සඳහන් කවි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.

වැසි වසිනා අහස අපි
මුතු බඳිනා මුහුද අපි
මිණි දිලෙනා පෙළොව අපි
සිරි ලංකා රටම අපි

අපේ පැතුම් අහසට විහිදී යයි
කම්හල්වල දුම් වළලු දිගේ
අපේ ද දහදිය මුගුරු ගලා එයි
ගං හෝ ඇළ දොළ කඳුරු වගේ

ගත රැඳි දුහුවිලි රනබරණයි
දහදිය මඩ විලුන් සුවඳයි
රට වෙනුවෙන් ගත සිත වෙහෙසෙයි
සිත සතුටේ උල්පත එතැනයි

ගොවියෝ අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ

1. මෙම කවි පෙළේ සඳහන් රට කුමක්ද ?
2. මෙම කවියේ සඳහන් රටේ ප්‍රධාන කොටස් තුන මොනවාද?.
3. කවියෙන් කියැවෙන ජල මූලාශ්‍රය 2 ක් නම් කරන්න .
4. මෙහි රනබරණ ලෙස සඳහන් වන්නේ කුමක්ද ?
5. මේ පදවලට අදාළ සමාන පද කවි පෙළෙන් තෝරා ලියන්න.

1 . ශරීරය .................. 2. මහන්සි ......................

**4.** පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.

ඇමරිකාවේ ජනතාව විසින් "මෙන්ලෝ උයනේ මායාකරු" නමින් හඳුන්වන ලද උතුම් මිනිසකු ඔබ අසා තිබේ ද? ඔහු මායාකාරයකු ලෙස හඳුන්වන ලද්දේ ඔහු නිපදවූ පුදුම සහගත දේවල් නිසා ය. ඒවායින් එකකි විදුලි බුබුළ. එය නිපදවා රාත්‍රිය ආලෝකමත් කළ ඔහුගේ නම තෝමස් අල්වා එඩිසන් ය. තෝමස් අල්වා එඩිසන්ට දිගු කලක් පාසල් අධ්‍යාපනය ලැබීමට තරම් ඉඩ ලැබුණේ නැතත් ඔහු තම මවගේ උදව්වෙන් කියවීමට ඉගෙන ගත්තේ ය. කියවීම ගැන ඔහු විශේෂ උනන්දුවක් දැක්විය.

1. විදුලි බුබුළ මුලින්ම නිපදවූ තැනැත්තාගේ නම කුමක් ද?
2. ඔහු කවර ජාතිකයෙක් ද?
3. ඔහු විශේෂ උනන්දුවක් දැක්වූයේ කුමක් කිරීමට ද?
4. ඔහුට කියවීමට ඔපකාර කළේ කවුද?
5. "මෙන්ලෝ උයනේ මායාකරු" යන නමින් හඳුන්වන්නේ කවුරුන් ද?

### III කොටස / பகுதி III

5 හා 6 යන ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.
5 மற்றும் 6 ஆகிய இரண்டு வினாக்களுக்கும் விடை எழுதுக.

**5.** ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පරිගණක දත්ත සහායකයන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවා ඇත.

- ශ්‍රී ලාංකේය පුරවැසියෙකු වීම
- වයස අවුරුදු 18-35 අතර වීම
- අ.පො.ස (සා/පෙළ) සමත් වී තිබීම
- අ.පො.ස (සා/පෙළ) සමත් වී තිබීම
- පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම
- අවුරුදු දෙකක සේවා පළපුරුද්දක් තිබීම

ඉහත සුදුසුකම් ඔබ සපුරා යැයි සිතා අදාළ තොරතුරු ඇතුළත් කරමින් අයදුම්පතක් සකස් කරන්න.

නැතහොත් / அல்லது

ළඟ එන අ.පො.ස (සා/පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා විද්‍යාලයේ අනෙකුත් සිසුන්ට ප්‍රවේශ පත්‍ර ලැබී ඇතත් ඔබේ ප්‍රවේශ පත්‍රය මේ වන තෙක් ලැබී නැත. ඒ බව දැනුම් දෙමින් විභාග ප්‍රවේශ පත්‍රය හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලමින් විභාග කොමසාරිස් ජනරාල් තුමාට යවන ලිපියක් ලියන්න.

6. පහත දැක්වෙන දෙමළ වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න .
கீழே தரப்பட்டுள்ள தமிழ் வாக்கியங்களை சிங்களத்தில் மொழி பெயர்க்க.

(i) எனக்கு இரண்டு வருட அனுபவம் உள்ளது.

(ii) மககளுக்கு சொத்துக்கள் சேதம் ஏற்பட்டுள்ளது.

(iii) உங்கள் வங்கிக் கணக்கு இலக்கம் என்ன?

(iv) நாட்டின் ஒற்றுமை பெறுமதியான வளமொன்றாகும்.

(v) நாங்கள் எதிர்காலச் சந்ததிக்காக வேலை செய்வோம்.

නැතහොත් / அல்லது

ලියුමක් , ලියාපදිංචි තැපෑලෙන් යැවීම සඳහා තැපැල් කාර්යාලයට යන ඔබ එහි සේවය කරන නිලධාරියකුගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගන්නා ආකාරය සංවාදයකට නගන්න.
පහත සඳහන් කරුණු උපයෝගී කරගෙන ලියන්න.

உங்களுக்கும் உரிய உத்தியோகத்தருக்கும் இடையே நடைபெறும் ஓர் உரையாடலை எழுதுக.

(i) සුබ පැතීම
(ii) ලියාපදිංචි පිළිබඳ ඔබ අසන තොරතුරු
(iii) නිලධාරිතුමා ඔබට ලබා දෙන පිළිතුරු
(iv) ස්තුති කිරීම

***********************